**බදුල්ල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 24 දිනද ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 08 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

### 1.2 මතය
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට බදුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ එකතුව රු.46,710 ක උපචිත වියදම් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) හිඟ හිටි ආදායම් රු.42,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ස්ථාවර වත්කම් 05 ක එකතුව රු.41,660,573 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ණයහිමි ශේෂය රු.1,717,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

#### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
------------------------------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 118,779,193 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.7,301,922 ක් විය.

### 1.3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) <u>1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය</u> | |
| (i) 180 වන රීතිය | ඇප තැබිය යුතු නිලධාරීන් 10 දෙනෙකු විසින් රු.37,000 ක වටිනාකමට ඇප තබා නොතිබුණි. |
| (ii) 146 වන රීතිය | මුදල් රැස්කිරීමේ කටයුතු ක්ෂේත්‍ර කම්කරුවෙකු වෙත පවරා තිබුණි. |
| (iii) 164 වන රීතිය | ආයතනය තුල ස්ථාපිත කර ඇති පරිගණක මෘදුකාංග වාර්තා හා මුද්‍රිත පිටපත් අධීක්ෂණයක් සිදුවන ආකාරයට අභ්‍යන්තර පාලන ක්‍රමයක් හඳුන්වා දී නොතිබුණි. |
| (iv) 218 වන රීතිය | 2015 වර්ෂය සඳහා ඉඩම් ගොඩනැගිලි සමීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 1:6 හා 4 වගන්තිය | සභාවේ සේවය කර ස්ථාන මාරුවී, විශ්‍රාම ලැබූ නිලධාරීන්ගෙන් හෝ ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් අය විය යුතු රු.13,326 ක් වටිනා ණය ශේෂ 07 ක් අයකර ගෙන නොතිබුණි. |
| (ඇ) 2009 සැප්තැම්බර් 18 දිනැති අංක රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සභාව විසින් වාහන 04 ක් සඳහා රු.151,006 ක PF/437 දරන රක්ෂණාවරණ ලබාගැනීමේ දී රක්ෂණ නියෝජිතයෙකු මාර්ගයෙන් ලබාගෙන තිබුණි. |
| (ඈ) 1980 අංක 47 දරන ජාතික පනත 23'අ' | සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක පරිසර ආරක්ෂණ පාරිසරික බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර හඳුනා ගැනීමට කටයුතු වගන්තිය කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,062,820 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,062,334 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

---------------------

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-------------------------------------

(අ) ඉකුත් වර්ෂයන්ට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සභා අරමුදලට ලැබිය යුතු හිඟ හිටි ආදායම රු.774,497 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ ආදායමෙන් 28% ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් හිඟ හිටිව තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුල ඉදිකර භාවිතයේ පවතින සම්ප්‍රේෂණ කුළුණු තුනක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු ප්‍රමාණය රු.8,059,104 ක් විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පළාත් පාලන සේවකයන්ගේ විශ්‍රාම වැටුප් අරමුදලට ප්‍රේෂණය කළ යුතු රු.562,002 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ප්‍රේෂණය කර නොතිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

---------------------------------------

4.1 **අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂයේ දී අයවැය ලේඛනය ආදායම් හා වියදම් පාලනයේදී පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

4.2 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

------------------------------

ප්‍රවර්තන වර්ෂයේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි.

4.3 **අභ්‍යන්තර විගණනය**

-----------------------

2015 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4.4 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

-------------------------------------------------------

ප්‍රවර්තන වර්ෂයේ විගණන කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පාලනය

(ඉ) තොග පාලනය

අනුව සභාව ස්ථාවර වත්කම් අගය කිරීම, හඳුනාගැනීම ගිණුම්ගත කිරීම් ප්‍රතිපත්තිය හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ අවසාන තොග අගයකිරීම් හා ගිණුම්ගත කිරීමේදී ගිණුම් ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

2.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේ දී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ රු.46,710 ක් වටිනා වියදම් අයිතම තුනක් ප්‍රවර්තන වර්ෂයේ ගිණුම්ගත කළ යුතු වුවත්, එයට පටහැනිව ඉදිරි වර්ෂයේ ගිණුම්ගත කර තිබුණි.



(ආ) පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ඉදිකරනු ලබන නව සභා ගොඩනැගිල්ලේ කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුට සපයනු ලබන විදුලිය හා ජලය වෙනුවෙන් ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්කරුගෙන් 2015 මාර්තු සිට දෙසැම්බර් දක්වා ජලය සඳහා අයවිය යුතු රු.24,000 ක් හා විදුලිය ගාස්තු සඳහා 2015 මැයි සිට දෙසැම්බර් දක්වා අයවිය යුතු රු.18,000 ක මුදල උපචිත ආදායම් ලෙස ගිණුම්ගත නොවීමෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අතිරික්තය හා ණයගැතියන්ගේ ශේෂය රු.42,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) බදුල්ල ප්‍රාදේශීය සභාව සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් අගය කිරීම, ගිණුම්ගත කිරීම යටතේ නියමිත වටිනාකම ගිණුම්ගත කළ යුතු වුවත්, ස්ථාවර වත්කම් 05 ක් සඳහා වටිනාකම රු.41,660,573 ක් අඩුවෙන් ගිණුම්ගත වීම හේතුවෙන් ආදායම් දායකවීමේ ගිණුම හා ස්ථාවර වත්කම් ගිණුම වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීම් කර්මාන්ත ණයහිමියන් 06 දෙනෙකු වටිනාකම රු.1,717,000 ක් ප්‍රවර්තන වර්ෂයේ ගිණුම්වල දෙවරක් සටහන් වීම මත මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ සභා ලේකම්ගේ වැඩ බැලීමේ දීමනාව රු.19,007 ක් ලැබිය යුතු ආදායමක් ලෙස වැඩියෙන් වෙන්කර ගිණුම් ගතකර තිබුණි.

2.2.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 118,779,193 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.7,301,922 ක් විය.



2.2.4 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | |
| (v) 180 වන රීතිය | ඇප තැබිය යුතු නිලධාරීන් 10 දෙනෙකු විසින් රු.37,000 ක ඇප තබා නොතිබුණි. |
| (vi) 146 වන රීතිය | මුදල් රැස්කිරීමේ කටයුතු ක්ෂේත්‍ර කම්කරුවෙකු වෙත පවරා තිබුණි. |
| (vii) 164 වන රීතිය | ආයතනය තුල ස්ථාපිත කොට ඇති පරිගණක මෘදුකාංග වාර්තා හා මෘද්‍රිත පිටපත් අධීක්ෂණයක් සිදුවන ආකාරයට අභ්‍යන්තර පාලන ක්‍රමයක් හඳුන්වා දී නොතිබුණි. |
| (viii) 218 වන රීතිය | 2015 වර්ෂය සඳහා ඉඩම් ගොඩනැගිලි සමීක්ෂණ කටයුතු සිදුකොට නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

-----------------------------------

(i) මු. රෙ.177

දෛනිකව රැස්කරනු ලබන මුදල් දිනපතා බැංකුවට ප්‍රේෂණය කළයුතු වුවත්, එසේ නොකර මුදල් අයකැමි භාරයේ රඳවාගත් අවස්ථා නිරීක්ෂණය විය.

(ii) මු.රෙ.445

2015 වර්ෂය වෙනුවෙන් නඩත්තු කළයුතු මුදල් පොත හා සුලු මුදල් පොත නඩත්තු කර නොතිබුණි.

-6-

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 1:6 හා 4 වගන්තිය

සභාවේ සේවය කර ස්ථාන මාරුවී, විශ්‍රාම ලැබූ නිලධාරීන්ගෙන් හෝ ඔවුන්ගේ ඇපකරුවන්ගෙන් අය විය යුතු රු.13,326 ක් වටිනා ණය ශේෂ 07 ක් අයකර ගෙන නොතිබුණි.

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛ

----------------------------

1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 චක්‍රලේඛය

සභාව සතු රථවාහන 06 ක් සම්බන්ධව ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

(ඉ) 2009 සැප්තැම්බර් 18 දිනැති අංක PF/437 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය

මෝටර් රථ සඳහා රක්ෂණාවරණ ලබාගැනීමේ දී සෘජුවම ජාතික රක්ෂණ භාර අරමුදල වෙතින් හෝ සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගින් පමණක් සලසා ගත යුතු වුවත්, එයට පටහැනිව සභාව විසින් වාහන 04 ක් සඳහා රු.151,006 ක් වටිනාකම රක්ෂණාවරණ ලබාගැනීමේ දී රක්ෂණ නියෝජිතයෙකු මාර්ගයෙන් ලබාගෙන තිබුණි.

(ඊ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත 23'අ'

(අ) පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන ව්‍යාපාර පිළිබඳවගන්තිය

විධිමත් සමීක්ෂණයක් මඟින් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ව්‍යාපාර බලපත්‍ර ලබාගැනීමේ දී එයට පෙර පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු වුවත්, පරිසර බලපත්‍ර නිකුත් කිරීමකින් තොරව අවස්ථා 05 කදී වෙළෙඳ බලපත්‍ර නිකුත් කර තිබුණි.

.



3. මූල්‍ය සමාලෝචනය

-----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,062,820 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,062,334 ක් විය. ඒ අනුව රු.1,000,486 ක වාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

------------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ වැඩිවීම පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචනයක් පහත දැක්වේ.

| පුනරාවර්තන ආදායම | 2015 | 2014 | විචලනය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් බදු | 1,833,500 | 1,826,724 | 6,776 |
| බදු කුලී | 378,400 | 406,450 | (28,050) |
| බලපත්‍ර ගාස්තු | 311,190 | 261,845 | 49,345 |
| සේවා සඳහා ගාස්තු | 1,341,135 | 639,383 | 701,752 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 5,051,175 | 6,002,713 | (951,538) |

| | | | | |
|---|---|---|---|---|
| වෙනත් ආදායම් | 1,469,043 | 850,391 | 618,652 | |
| ආදායම් ආධාර | 22,610,323 | 17,160,774 | 5,449,549 | |
| | | | ------------- | 5,846,486 |



පුනරාවර්තන වියදම
---------------------

| | | | | |
|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 24,016,047 | 17,624,644 | 6,391,403 | |
| ගමන් වියදම් | 317,499 | 367,018 | (49,519) | |
| සැපයුම් හා උපකරණ | 1,544,835 | 1,251,282 | 293,553 | |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 1,163,648 | 930,027 | 233,621 | |
| ප්‍රවාහන සම්බන්ධතා, ආවශ්‍යක හා වෙනත් සේවා | 2,703,680 | 3,520,942 | (817,262) | |
| පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 32,444 | 19,688 | 12,756 | |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 147,489 | 1,372,344 | (1,224,855) | |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 6,303 | - | 6,300 | |
| | | | --------------- | (4,846,000) |
| | | | | -------------- |
| මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ වැඩිවීම | | | | 1,000,486 |
| | | | | ========= |

3.3 **ආදායම් පරිපාලනය**
---------------------

3.3.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**
------------------------------------

(අ) ඉකුත් වර්ෂයන්ට අදාලව 2015 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සභා අරමුදලට ලැබිය යුතු හිඟ හිටි ආදායම රු.774,497 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ ආදායමෙන් 28% ක් (රු.367,262) ක් 2015 දෙසැම්බර් 31 දින වන විටත් හිඟ හිටිව තිබුණි.

(ආ) සභා බල ප්‍රදේශය තුල ඉදිකර භාවිතයේ පවතින සම්ප්‍රේෂණ කුළුණු තුනක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.



3.3.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් නිළධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ හා මුද්දර ගාස්තු එකතුව රු.8,059,104 ක් ලැබිය යුතුව තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 29 වන දින වැඩිපුර බැංකු ගතකොට ඇති රු.3,664 ක මුදල පියවීම සඳහා අනුමැතියකින් තොරව 2016 ජනවාරි 08 හා 16 යන දෙදින දෛනික මුදල් එකතුවෙන් එම මුදල අඩුකර බැංකු ගතකොට තිබුණි.

(ආ) 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල දායක මුදල් සඳහා නියමිත දිනට නොගෙවීම මත රු. 997 ක අධිභාරයක් ගෙවා තිබුණි.

(ඇ) 1993 සැප්තැම්බර් 03 දිනට පෙර විශ්‍රාම ගන්වන ලද පළාත් පාලන සේවකයන්ගේ විශ්‍රාම වැටුප් වෙනුවෙන් 2013 ඔක්තෝබර් 10 දින සිට පැවත එන රු.562,002 ක මුදල පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට ප්‍රේෂණය කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ කඩ කුලී නොගෙවූ කුලීකරුවන් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු.82,046 ක බදු මුදල් අයකර ගැනීමට හෝ ගිවිසුම අවසන් කිරීමට කටයුතු කොට නොතිබුණි.

4.2. **මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

මුදල් රෙගුලාසි 237 ප්‍රකාර වවුචරයක් සහතික කිරීමේදී අදාල උපලේඛන ඉදිරිපත් කළයුතු වුවද 2015 නොවැම්බර් 27 දින පැවති ප්‍රගති සමාලෝචන රැස්වීමට ආහාර සැපයීම වෙනුවෙන් 2015 දෙසැම්බර් 11 දිනැති වවුචර් අංක 32 මඟින් පුද්ගලයින් 150 කට ආහාර සැපයීම සඳහා රු.93,000 ක් ගෙවා තිබුණි. පැමිණීමේ ලේඛන පරීක්ෂාවේ දී සහභාගි වූ නිලධාරීන් 43 දෙනෙකු වූ බැවින් අතිරේක පුද්ගලයින් 107 වෙනුවෙන් දරන ලද රු.66,340 ක් සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.



5. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

5.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 24 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

5.2 **අයවැය පාලනය**

ප්‍රාදේශීය සභාවේ 2015 වර්ෂයේ අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී පහත සඳහන් විචලනයන් නිරීක්ෂණය විය.

| පුනරාවර්තන ආදායම | අයවැයගත | තථ්‍ය | විචලනය | විචලන ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| වරිපනම් හා බදු | 956,231 | 1,833,500 | 877,264 | 9.2 |
| කුලී | 374,900 | 378,400 | 3,500 | 0.9 |
| සේවා සඳහා ගාස්තු | 2,707,000 | 1,341,185 | 1,365,865 | 50 |
| ආදායම් ආධාර | 29,185,884 | 22,610,322 | 6,575,562 | 23 |
| **පුනරාවර්තන වියදම්** | | | | |
| වැටුප් හා දීමනා | 30,832,384 | 24,016,047 | 6,816,332 | 22 |
| ගමන් වියදම් | 404,200 | 317,800 | 86,700 | 21 |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 1,310,000 | 1,163,648 | 146,352 | 11 |
| ප්‍රවාහන සම්බන්ධතා, ආවශ්‍යක හා වෙනත් සේවා | 3,944,840 | 2,703,680 | 1,241,166 | 31 |
| පොලී ගෙවීම්, ලාභාංශ හා | | | | |

| | | | | |
|---|---|---|---|---|
| ප්‍රසාද මුදල් | 10,000 | 32,444 | (22,444) | 224 |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 848,000 | 147,489 | 700,511 | 83 |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 25,000 | 6,303 | 18,697 | 75 |
| සැපයුම් හා උපකරණ | 1,115,000 | 1,544,835 | 429,835 | 39 |



5.3 **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------------

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 වන පරිච්ඡේදයේ 4:2 අනුව සභාවේ මිලදී ගැනීම් හා ඉදිකිරීම් සම්බන්ධයෙන් වාර්ෂිකව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

5.4 **අභ්‍යන්තර විගණනය**

----------------------

2015 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5.5 **විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

----------------------------------------------------

රාජ්‍ය ආයතන වල විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීම සම්බන්ධයෙන් වූ 1999 නොවැම්බර් 19 දිනැති අංක පීඑෆ්/පීඊ/3 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන පරිදි ආයතනයේ මූල්‍යමය විචක්ෂණභාවය හා මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා වූ විගණන හා කළමනාකරණ කමිටු වෙනුවෙන් විධිමත්ව අවම වශයෙන් කාර්තුවකට එක බැගින් වර්ෂයක් සඳහා 04 ක් පැවතිය යුතු වුවද 2015 වර්ෂය වෙනුවෙන් විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කොට නොතිබුණි.

6. **පද්ධති හා පාලන**

------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) අභ්‍යන්තර පාලනය

(ආ) කොන්ත්‍රාත් පාලනය

(ඇ) තොග පාලනය

(ඈ) ආදායම් පරිගණක මෘදුකාංග පද්ධතිය අභ්‍යන්තර පාලනය

(වයි.එම්.චන්ද්‍රසේකර බණ්ඩා)
සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.